# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## ⑦ විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 11 ශ්‍රේණිය

## නිෂ්පාදන පිරිවැය ලේඛන

වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. නිෂ්පාදන පිරිවැය යන්න විස්තර කෙරෙන නිවැරදි පිළිතුර වන්නේ,
   1) යම් නිෂ්පාදිත ඒකකයක් සමඟ ඍජුවම හඳුනාගත හැකි වියදම්
   2) යම් නිශ්චිත කාලච්ඡේදයක යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරීමට දරන ලද වියදම්වල එකතුව
   3) යම් භාණ්ඩයක් නිපදවීමට සහභාගි වන ශ්‍රමිකයන්ට ගෙවන වැටුප් එකතුව
   4) යම් නිෂ්පාදිත ඒකකයක් සමඟ ඍජුව හඳුනාගත නොහැකි වියදම්

2. පිරිවැයෙහි ස්වභාවය අනුව නිෂ්පාදන පිරිවැය බෙදනු ලබන ප්‍රධාන කොටස් 2 වනුයේ,
   1) ද්‍රව්‍ය පිරිවැය හා ශ්‍රම පිරිවැය
   2) ඍජු පිරිවැය හා වක්‍ර පිරිවැය
   3) ඍජු ශ්‍රම පිරිවැය හා ඍජු වෙනත් පිරිවැය
   4) වක්‍ර ශ්‍රම පිරිවැය හා වක්‍ර වෙනත් පිරිවැය

3. ප්‍රාථමික පිරිවැයට අදාල මූලිකාංග වනුයේ,
   1) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය, ඍජු ද්‍රව්‍ය පිරිවැය
   2) ඍජු නිෂ්පාදන පිරිවැය හා වක්‍ර ද්‍රව්‍ය පිරිවැය
   3) ඍජු ද්‍රව්‍ය පිරිවැය, ඍජු ශ්‍රම පිරිවැය, ඍජු වෙනත් පිරිවැය
   4) වක්‍ර ද්‍රව්‍ය පිරිවැය, වක්‍ර ශ්‍රම පිරිවැය, වක්‍ර වෙනත් පිරිවැය

4. පහත වගුවේ A තීරුවේ නිෂ්පාදන ආයතනවල වියදම් අයිතම කිහිපයක් ද, B තීරුවේ නිෂ්පාදන පිරිවැය මූලිකාංග කිහිපයක් ද දැක්වේ.

| A | B |
|---|---|
| 1. උළු නිෂ්පාදනාගාරයක මැටි සඳහා වියදම | P වක්‍ර වෙනත් පිරිවැය |
| 2. පොත් කතෘවරයාට ගෙවන කතෘභාගය | Q ඍජු වෙනත් පිරිවැය |
| 3. ලී බඩු නිමැවුම් ආයතනයකන වඩු කාර්මිකගේ වැටුප | R ඍජු ද්‍රව්‍ය පිරිවැය |
| 4. බේකරියක විදුලි වියදම | S ඍජු ශ්‍රම පිරිවැය |

ඉහත A තීරුවේ වියදම් B තීරුවේ පිරිවැය මූලිකාංග සමඟ පිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර වනුයේ,

1) R Q P S
2) R Q S P
3) P Q S R
4) P Q R S

5. මහා පරිමාණ වී මෝලක් පවත්වාගෙන යන විමල් තම නිෂ්පාදන පිරිවැය වැඩිවීම හේතුකොට ගෙන පාලන මිලට සහල් ලබා දීමේ අපහසුතාවයක් ඇති විය. මෙසේ නිෂ්පාදන පිරිවැය වැඩි වීමට හේතු සොයා බැලීමේ දී දැනගත හැකි වනුයේ,

a. මාසික විදුලි බිල ඉතා ඉහළ බවත්
b. සුපරීක්ෂණ නිලධාරීන්ගේ අතිකාල දීමනා සඳහා වැඩි වැටුපක් ගෙවා ඇති බවත්
c. වී කෙටුම් යන්ත්‍ර නිතර අළුත්වැඩියා කර ඇති බවත්ය.

මෙහි සඳහන් a,b,c යන වියදම් අයිතම අයත්වන පිරිවැය මූලිකාංග පිළිවෙලින් දැක්වෙන පිළිතුරු වනුයේ,

1) සෘජු වෙනත් පිරිවැය, වක්‍ර ශ්‍රම පිරිවැය, වක්‍ර වෙනත් පිරිවැය
2) සෘජු වෙනත් පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය, සෘජු ද්‍රව්‍ය පිරිවැය
3) වක්‍ර වෙනත් පිරිවැය, වක්‍ර ශ්‍රම පිරිවැය, වක්‍ර වෙනත් පිරිවැය
4) වක්‍ර වෙනත් පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය, වක්‍ර වෙනත් පිරිවැය

6. ලී බඩු කර්මාන්ත ශාලාවකට අදාල වියදම් අයිතම කිහිපයක් පහතින් දැක්වේ. ඒවා අයත් වනුයේ ප්‍රාථමික පිරිවැයට ද, නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයට ද යන්න (√) ලකුණ යොදා වර්ග කර දක්වන්න.

| | | ප්‍රාථමික පිරිවැය | නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය |
|---|---|---|---|
| i. | දැව සඳහා වන වියදම | ………………… | ………………… |
| ii. | වඩු කාර්මිකයන්ගේ වැටුප | ………………… | ………………… |
| iii. | වඩු සහයකයින්ගේ වැටුප | ………………… | ………………… |
| iv. | විදුලිය වියදම | ………………… | ………………… |
| v. | ලී ඉරුම් යන්ත්‍ර අළුත්වැඩියාව | ………………… | ………………… |
| vi. | පොලිෂ්, වැලි කඩදාසි සඳහා වියදම | ………………… | ………………… |
| vii. | ලිපිකරුගේ වැටුප | ………………… | ………………… |
| viii. | කර්මාන්ත ශාලා කුලිය | ………………… | ………………… |

7. පහත දැක්වෙන සමීකරණවල හිස්තැන්වලට සුදුසු නිවැරදි යෙදුම ලියා දක්වන්න.

i. ඍජු නිෂ්පාදන පිරිවැය + වක්‍ර නිෂ්පාදන පිරිවැය = .....................

ii. ප්‍රාථමික පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය = .....................

iii. ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + ................... = ප්‍රාථමික පිරිවැය

iv. වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රම පිරිවැය +..................... = නිෂ්පාදන පොදු කාර්ය

v. ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රම පිරිවැය + ඍජු වෙනත් පිරිවැය + ........... = මුළු නිෂ්පාදන පිරිවැය

vi. වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රම පිරිවැය + වක්‍ර වෙනත් පිරිවැය + ........... = මුළු නිෂ්පාදන පිරිවැය

8. [ .................... ] = මුළු නිෂ්පාදන පිරිවැය / නිෂ්පාදන ඒකක ප්‍රමාණය

මෙම සූත්‍රයෙන් හිස්තැනට අදාළ පිළිතුර වන්නේ,

1) ප්‍රාථමික පිරිවැය
2) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය
3) නිෂ්පාදන ඒකක පිරිවැය
4) ඒකකයක විකුණුම් මිල

9. භාණ්ඩක විකුණුම් මිල තීරණය කිරීම සඳහා එකතු කරනු ලබන ලාභාන්තිකය ඉතා වැඩි අගයක් ගතහොත්

1) භාණ්ඩයේ විකුණුම් මිල අඩු වේ.
2) භාණ්ඩයේ විකුණුම් මිල වැඩි වේ.
3) භාණ්ඩයේ ඉල්ලුම වැඩි විය හැක.
4) භාණ්ඩයේ ගැනුම්කරුවන් වැඩි විය හැක.

10. නිෂ්පාදිතයක විකුණුම් මිල නියම කිරීමේ දී සලකා බලන ප්‍රධාන සාධකය වන්නේ,

1) භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම
2) ආදේශන භාණ්ඩවල මිල ගණන්
3) ආයතනයේ මිල කිරීමේ ප්‍රතිපත්ති
4) නිෂ්පාදිතයේ පිරිවැය

11. ඒකකයක විකුණුම් මිල = [ ] + ඒකකයක ලාභාන්තිකය

ඉහත සමීකරණයෙහි හිස්තැනට සුදුසු නිවැරදි යෙදුම වන්නේ,

1) ඒකකයක ප්‍රමාණය
2) ඒකකයක පිරිවැය
3) ඒකකයක ප්‍රාථමික පිරිවැය
4) මුළු නිෂ්පාදන පිරිවැය

12. පරිගණකය ඇසුරින් පිරිවැය ලේඛනයක් සකසා ගැනීම සඳහා වඩාත් සුදුසු පරිගණක මෘදුකාංගය වනුයේ,

1) Word
2) Exel
3) Powerpoint
4) Access

13. පාසල් බෑග් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක 2021 ජනවාරි මාසයේ නිපද වූ බෑග් සංඛ්‍යාව 250ක් වූ අතර ඒ සඳහා වැය වූ මුළු නිෂ්පාදන පිරිවැය රු.250,000ක් විය. එක් බෑගයක් සඳහා රු. 200ක ලාභාන්තිකයක් තබා ගනියි නම් නිෂ්පාදන පිරිවැය මත ලාභාන්තිකයේ ප්‍රතිශතය කොපමණද?

| | |
|---|---|
| 1) 30% | 2) 20% |
| 3) 25% | 4) 10% |

පහත තොරතුරු උපයෝගී කරගෙන අංක 14-17 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

ඩෙනිම් කලිසම් නිෂ්පාදනය කරනු ලබන ඇඟළුම් ආයතනයක 2020 ජනවාරි මාසයේ මසන ලද කලිසම් වලට අදාල නිෂ්පාදන පිරිවැය තොරතුරු පහත සඳහන් වේ.

| | |
|---|---|
| ඩෙනිම් රෙදි සඳහා | රු.100 000 |
| මහන මැෂින් ක්‍රියාකරුවන්ගේ වැටුප | රු. 90 000 |
| වෙනත් සෘජු වියදම් | රු. 10 000 |
| නූල් හා රෙදි වර්ණකාරක ද්‍රව්‍ය (ඩයි) සඳහා | රු. 15 000 |
| සුපරීක්ෂක වේතන | රු. 40 000 |
| ආරක්ෂක නිලධාරී වැටුප | රු. 30 000 |
| ගොඩනැගිලි කුලිය | රු. 15 000 |
| විදුලිය වියදම් හා ජල ගාස්තු | රු. 5 000 |
| ගොඩනැගිලි රක්ෂණ වියදම් | රු. 10 000 |
| මහන මැෂින් ක්ෂය | රු. 5 000 |

ජනවාරි මාසය තුළදී ඩෙනිම් කලිසම් 160ක් නිෂ්පාදනය කරන ලදී. පිරිවැය මත 30%ක ලාභාන්තිකයක් තබා ගෙන කලිසමක විකුණුම් මිල තීරණය කරයි.

14. ජනවාරි මාසය තුළ දී නිපදවන ලද කලිසම්වලට අදාල ප්‍රාථමික පිරිවැය කීයද?

| | |
|---|---|
| 1) රු.100 000 | 2) රු.110 000 |
| 3) රු.190 000 | 4) රු.200 000 |

15. ජනවාරි මාසය තුළ දී නිපදවන ලද කලිසම්වලට අදාල නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය කීයද?

| | |
|---|---|
| 1) රු.200 000 | 2) රු.220 000 |
| 3) රු.120 000 | 4) රු.300 000 |

16. ජනවාරි මාසය තුළ නිපදවන ලද එක් ඩෙනිම් කලිසමක නිෂ්පාදන පිරිවැය කීයද?

1) රු.750
2) රු.1 250
3) රු.1 750
4) රු.2 000

17. ඩෙනිම් කලිසමක විකුණුම් මිල කීයද?

1) රු.2 600
2) රු.2 300
3) රු.3 000
4) රු.3 200

18. යෝගට් නිෂ්පාදනය කර අලෙවිකරණ සනුකගේ ව්‍යාපාරයේ 2021 මාර්තු මාසයට අදාල නිෂ්පාදන වියදම් පහත දැක්වේ.

| | |
|---|---|
| කිරි මිලදී ගැනීම | රු. 80 000 |
| යන්ත්‍ර නඩත්තු වියදම් | රු.150 000 |
| නිෂ්පාදන වැටුප් | රු. 50 000 |
| සෘජු වෙනත් වියදම් | රු. 10 000 |
| නිෂ්පාදන සහයක වැටුප් | රු. 30 000 |
| රස කාරක හා වර්ණකාරක ද්‍රව්‍ය | රු. 3 000 |
| කම්හල් විදුලිය | රු. 5 000 |
| කම්හල් කුලිය | රු. 5 000 |
| යන්ත්‍ර ක්ෂය | රු. 2 000 |

අවශ්‍ය වන්නේ,
ඉහත සඳහන් තොරතුරු ඇසුරින් සනුකගේ ව්‍යාපාරයේ 2021 මාර්තු මාසයට අදාල නිෂ්පාදන පිරිවැය ලේඛනයක් සකස් කරන්න.

19. හසිත විසින් වේවැල් පුටු කට්ටල අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර 2021 ජනවාරි මාසය තුළදී ඔහු විසින් පුටු කට්ටල 5ක් නිෂ්පාදනය කරන ලදී. පුටු කට්ටලයක් පුටු 6කින් සමන්විත වන අතර ජනවාරි මාසය තුළ දරණ ලද පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| මුළු නිෂ්පාදන පිරිවැය | රු.150 000 |
| වේවැල් සඳහා පිරිවැය | රු. 70 000 |
| සෘජු ශ්‍රමය සඳහා පිරිවැය | රු. 25 000 |
| සෘජු වෙනත් වියදම් | රු. 5 000 |

අවශ්‍ය වන්නේ,

1) එක් පුටුවක නිෂ්පාදන පිරිවැය
2) 2021 ජනවාරි මාසයට අදාල නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය
3) රු.210 000 ට පුටු කට්ටල 5ම අලෙවි කරන ලද්දේ නම් එක් පුටු කට්ටලක් විකිණීමෙන් ලැබෙන ලාභය

20. මැයි මාසය ආරම්භයත් සමඟ භක්ති වෙසක් කූඩු සාදා අලෙවි කිරීමේ කෙටි කාලීන ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කරන ලදී. එහිදී වෙසක් කූඩුවක් නිර්මාණය සඳහා රු.30ක මුදලක් වැයවන බව ගණන් බලන ලදී.

මැයි මාසය තුළදී දරණ ලද නිෂ්පාදනයට අදාල වියදම් පහත පරිදි වේ.

| | |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | රු.3 000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | රු.6 000 |
| වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | රු.1 500 |
| වක්‍ර වෙනත් වියදම් | රු. 500 |

අවශ්‍ය වන්නේ,

1) මැයි මාසය තුළදී නිර්මාණය කරන ලද වෙසක් කූඩු සංඛ්‍යාව
2) වෙසක් කූඩු නිෂ්පාදනයේදී දරණ ලද වක්‍ර ශ්‍රම පිරිවැය

21. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ තම ආයතනික සමාජ වගකීම ඉටු කරනුයේ ශක්ති සමාගම තවත් රෝහල්වල දැඩි සත්කාර ඒකක සඳහා අවශ්‍ය ඇඳන් 10ක් නිෂ්පාදනය කිරීම සඳහා ඇණවුමක් ඒ පිළිබඳ කාර්මික තාක්ෂණික දැනුමින් යුතු කසුන් වෙත බාර දෙන ලදී.

ඉතා කැමැත්තෙන් එම ඇනවුම භාරගත් කසුන් නිෂ්පාදන පිරිවැය අවම වන අයුරින් ඇඳන් නිෂ්පාදනය සඳහා සැලසුමක් සකස් කරන ලදී. ඇඳන් සකස් කිරීම සඳහා එක් කාර්මික ශිල්පියෙකු හා ඔහුගේ සහායට සේවකයන් දෙදෙනෙකු යොදවන ලදී. නිෂ්පාදන ඒකක 10 සඳහා පහත සඳහන් වියදම් දරණ ලදී.

| | | |
|---|---|---|
| මූලික අමු ද්‍රව්‍ය - | මිලට ගැනුම් | රු. 100 000 |
| | ණයට ගැනුම් | රු. 500 000 |

- විදුලිය වියදම් රු. 40 000
- තීන්ත පොලිෂ් රු. 60 000
- කාර්මික ශිල්පියාගේ වැටුප රු. 100 000
- එක් සේවකයෙකුට රු. 50 000 බැගින් ගෙවන ලදී.
- ඍජු වෙනත් වියදම් රු. 100 000

i. ඉහත සිද්ධිය සඳහන් නිෂ්පාදන පිරිවැය මූලිකාංග නම් කරන්න.
ii. එම නම් කළ පිරිවැය මූලිකාංග සඳහා සිද්ධිය ඇසුරින් උදා. දක්වන්න.
iii. නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම තුළින් කසුන්ට ලබා ගත හැකි ප්‍රයෝජන 02ක් දක්වන්න.
iv. ඇඳන් නිෂ්පාදනයට අදාළ ප්‍රාථමික පිරිවැය කීයද?
v. ඇඳන් නිෂ්පාදනයට අදාල නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය කීයද?
vi. එක් ඇඳක නිෂ්පාදන පිරිවැය කීයද?
vii. පිරිවැය මත 30%ක ලාභාන්තිකයක් තබා ගනිමින් විකුණුම් මිල නියම කරයි නම්, ඇඳක විකුණුම් මිල කීයද?
viii. ඇඳක විකුණුම් මිල රු.136 000 දක්වා වැඩි කරයි නම් එවිට කසුන් තබා ගන්නා ලාභාන්තිකය කොපමණද?